සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**අවසාන වාර පරීක්ෂණය 2020** **12 ශ්‍රේණිය**
மூன்றாம் தவணைப் பரீட்சை **2020** தரம் **12**
**Last Term Test 2020** **Grade 12**

සිංහල භාෂාව හා සාහිත්‍යය **I**
**சிங்களமொழியும் இலக்கியமும்** **I**
Sinhala Language And Literature **I**

පැය තුනයි
**மூன்று மணித்தியாலம்**
Three Hours

) සැලකිය යුතුයි (

- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

* පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් **හතරක්** තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ( මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදාගන්න.)

1 (අ) බුදුහු එදවස් අලුයම් වේලෙහි මහකුලුණු සමවතට සමවැද එයින් නැගී පෙර බුදු වූ බුදුවරුන් වහන්සේ සමයෙහි මහත් කොට පුරා පී පින්කම් ඇති හේතුසම්පන්න පුද්ගලයන් දක්නා පිණිස බුදු ඇසින් ලොව බලන සේක්, දසදහසක් සක්වළ නැමති මහමුහුද වසා **නුවණදැල** දමූ සේක. මට්ටකුණ්ඩලී නමැති කුඩමසු පිළ නැමති දිය කෝල්බඩ හොත්තේ බුදුන්ගේ නුවණ දැලට තමා සම්භ වුවමනා හෙයින් වැදහොත් ලෙසින් ම නොසෙල්වී නොපෙරළී නුවණදැල බැඳීණ. බුදුහු ඔහු දැක මා එතැනට යාමෙන් වන ප්‍රයෝජන කවරේදෝහො පරීක්ෂා කරනසේක්, මා එතැනට ගිය කල මට්ටකුණ්ඩලියා මා කෙරෙහි සිත පහදවාගෙන කොටගත් අනික් පින්කමක් නැතත් සිත පහදවාගත් පමණකින් මියගොසින් තවුතිසා දෙව්ලොව එක්සිය විසිගවුවක් විතර උස ඇති රන්විමනක උපද්දී, ඔහු පිරිවරා දෙවඟනෝ දහසක් දෙන පහළ වෙති.

(i) මට්ටකුණ්ඩලී දෙව්ලොව උපත ලබන්නේ කුමන පින්කමක් හේතු කොටගෙන ද?
(ii) බුදුන් අලුයම් වේලාවෙහි ලෝකය දෙස බැලූවේ කුමක් පිණිස ද?
(iii) "මට්ටකුණ්ඩලී නමැති කුඩමසු පිළනැමති දිය කෝල්බඩ හොත්තේ.." මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(iv) " **නුවණදැල**"යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

(ආ) බිසොවු තුන්වාරයක් කැවුම් යවා කුසීත ව "දරුවන් පැරදි පැරදි සේ මම කැවුම්තලි යවාගත නොහෙමි. ඉතිකින් ගෙයි කැවුම් නැතැයි" කියා යවුවාහුය. අනුරුද්ධකුමාරයෝ "කැවුම් නැතැ"යි කියා යවූ බස් අසා තමා උපන් තැන් පටන් "නැතැ"යි යන බසක් නොඇසූ විරූ හෙයින් "නැතැ"යි යන බසෙහි අර්ථය නොදන "නැති පූ කියා කැවුම් ජාතියක් ඇති වනැ"යි සිතා "එ නැති පූ වහා එවන්නේය"යි කියා යවුවාහුය. මෑණියෝ එබස් අසා " මාගේ පුතණුවෝ ශ්‍රීමත් කුලෙහි උපන් හෙයිනුත් මහපින් ඇති හෙයිනුත් නැතැයි යන බසෙහි අර්ථ නොදනිති. මපුතුනුවන් මතු රාජ්‍යය කරන කල නැතැයි යන බසක් නොකියා රාජ්‍යය කළ නොහැක්කේ ම වේ ද, මපුතුණුවන් නැතැයි යන බසෙහි අර්ථය උගන්වමි" යි සිතාලා **රන්තලියක්** ශුද්ධ කරවාපියා අනික් රන්තලියකින් වසාලා "තෙල නැති පූ මපුතුණුවන්ට දෙව"යි කියා නිකම් තලිය යවුවාහුය.

(i) අනුරුද්ධ කුමරා නැත යන බසෙහි අර්ථය නොදැන සිටියේ නිසාද?
(ii) බිසව කැවුම් යැවීම ප්‍රතික්ෂේප කළේ ඇයි?
(iii) "තෙල නැති පූ මපුතුණුවන්ට දෙව"යි මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(iv) " **රන්තලියක්**"යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

(ඇ) එසඳ බරණැස් රජ්ජුරුවෝ ඒ ගායනා ශබ්දය අසා පියසන් නොඇසෙන සේ සෙමෙන් සෙමෙන් අවුදින් ලියකිඳුරාණන් උන් නියා ව ද නටමින් සිටි කිඳුරාඞ්ගනාවන් ද දැක පිළිබඳ වූ සිත් ඇතිව ''මේ කිඳුරා විද දිවි තොර කොට ''මැ හා සමග වාසය කළෙම් නම් යහපතැ''යි සිතා සැඟවී සිට කිඳුරාට හීයක් විද්දේය. ඒ **ශර ප්‍රහාරයෙන්** වැහෙන්නා වූ ලේ දියෙන් මහත් වේදනාවෙන් මඬනා ලදුව හඬන්නේ ය. ''සබඳ චන්ද්‍රිකාව මේ මාගේ ජීවිතය තවද ආයු ඇතිව තිබිය දී සන්තතිවිච්ඡේදයෙන් නැසෙමි සිතමි එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදයෙහි නොඇලෙමි. ලද ශරප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලෙහෙයෙන් රැඳී ඔත්තා වූ මාගේ ජීවිතය නොබෝ කලකින් ම සැඟවෙන්නේ ය''

(i) බරණැස් රජු මෙම ස්ථානයට පැමිණයේ කුමක් නිසාද?
(ii) කිඳුරා මැරීමෙන් රජු අපේක්ෂා කළේ කුමක්ද?
(iii) '' ''සබඳ චන්ද්‍රිකාව මේ මාගේ ජීවිතය තවද ආයු ඇතිව තිබිය දී සන්තතිවිච්ඡේදයෙන් නැසෙමි ''මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(iv) '' **ශර ප්‍රහාරයෙන්** ''යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

(ඈ) ''ආචාරීන් වහන්ස නුඹ වහන්සේගේ භාර්‍යා වූ ස්වර්ණතිලකාවන් දක්නා කැමැත්තම්හ''යි කීහ. එතෙපුල් අසා බමුණාණෝ ''ස්වර්ණතිලකාවන් කැඳවාගෙන එව''යි මිනිසුන් යැවූහ. ඒ ගිය මනුෂ්‍යයන් ස්වර්ණතිලකාවන් කැඳවාගෙන වීථි මධ්‍යයට පැමිණි කල්හි මඳ නැඟී සිටි **මොළ ඇතෙකු** රා පොවා මත් කරවා, ඇත් කොහොලින් ඇන කුප්පවා ඉදිරියෙහි ලුහුබඳවාලූහ. එකල්හි රා බී මත් වූ, කුඤ්චනාදයෙන් දස දිග් පුරමින් ඒ ඒ අත මිනිසුන් ලුහුබඳවමින් සෙන පහරන සේ දිව අවුත් වන්නා වූ ඒ ඇත් තෙම ස්වර්ණතිලකාව දැක එකිණෙහි උපන්නා වූ ස්නේහයෙන් සොඬින් ගෙන ඔසවා තමාගේ කුඹ මත්තෙහි තබා ගත''

(i) මිනිසුන් ඇතාව කෝපගැන්වූ ආකාරය ලියා දක්වන්න.?
(ii) මෙම ඡේදයෙහි ඇතුළත් උපමානයක් ලියා දක්වන්න.
(iii) "කුඤ්චනාදයෙන් දස දිග් පුරමින් ඒ ඒ අත මිනිසුන් ලුහුබඳවමින්." මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(iv) "**මොළ ඇතෙකු** '' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

(ඉ) ඔහු තෙද දිවසක ර
දිලිහෙත විකුම් ගිරිසි ර
පෙරසිටි රඟ නොහැ ර
සිටිද පරරද යස තුසරක ර

සුරත ඔහු යුදය ට
සුරත ලෙලදෙත කගප ට
සුරත මිස යුගදි ට
සුරත නම් කොද රුපඹුවන් හ ට

(i) රජතුමාගේ තේජස සමාන කර ඇත්තේ කාටද?
(ii) පළමු කවියෙහි ''තුසරකර'' යන්නට සමාන කර ඇත්තේ කුමක්ද?
(iii) සුරත මිස යුගදි ට
සුරත නම් කොද රුපඹුවන් හ ට
මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(iv) " රුපඹුවන් " යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

(ඊ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) ''යම් ලෙසකින් කළ කල මාගේ වස්තුවට හානියක් නොවේ නම් ඒ ලෙසක් කෙරෙමි''

(ii) "යහළු දෙබසක් නොකියව, මහණ වන්නට යම්හ''

(iii) ''තී හඬන්නට කාරණා කවරේ දැ යි මමතී පාදපරිචාරිකාකොට සොළොස් දහසක් පුරාංගනාවන්ට අග මෙහෙසුන් කෙරෙමි.''

(iv) ''ඊට කිසි සැකයක් නොසිතා ඉතා ප්‍රපඤ්ච ව නොකොට උදාසනින් ම නික්මුණු මැනව''

(v) ''උඹ අදට ගෙනියන හතරවෙනි දිය හට්ටිය නේද මේ? මං දැහින් දැක්කා.''

(vi) ''නොවෙමි සම ඔබ බිසව තනතුරට - ඇදුරිඳුනි මම සැඩොල් දුවක් වෙමි.''

(vii) "අන්දො අයියාගේ පොල්ලෙලි අද්දන්න වෙන ගොනෙක් සොයාගන්න"

(උ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

දුදනොද බිඳ
ලද තෙද කඳ
කඳ දෙව් රද
සාමිනේ

මගෙ කුකුළා නැසූ එකා
දදය ඔබගෙ පාලු යකා
තව එක බුද දිනක් තකා
ඉන්නට ඉඩ නොදී මකා

බලා එල්ල
හෙලුව හෙල්ල
මුලැ මැ බෙල්ල
මරු තැනේ

කතරගමට රුහුණු රටේ
හිඟා කකා ලබන විටේ
පයින් මැ ගොස් ඇවිදැ වටේ
පොළොවැ උලා නළල් ඇටේ

දිගට ඇදී
නැගැ පැහැදී
මහ හඬ දී
දෙවියනේ

රනින් කුකුළු රුවක් පුදමි
රිදියෙන් බිජු වටක් පුදමි
රන් දුනු හී දෙකක් පුදමි
රුවට එරන් රුවක් පුදමි

කතර ගමේ
බල මහිමේ
දුටු ද ඒ - මේ
හැමතැනේ

කියමින් නම'කුරු ඔබගේ
බොළඳුන්ගෙ ද කිරි තුඩගේ
රඟ දෙන්නට වඩමි අගේ
එක'තින් හිමි සඳුනි මගේ

| | | | |
|---|---|---|---|
| දුදනොද | බිඳ | මට කළ මෙ-විපත | අනේ |
| ලද තෙද | කඳ | බලාගන්න | දෙවියනේ |
| කඳ දෙව් | රද | වැජඹෙන නා | මෙ-විමනේ |
| | සාමිනේ | බලන්නැ නා | සාමිනේ |

2. දැඩි මසුරකුගේ යථා ස්වරූපය පාඨක මණසෙහි මැනවින් නිරූපණය වන පරිදි අදින්නපුබ්බක චරිතය ගොඩනැංවීමට සද්ධර්මරත්නාවලී කතුවරයා උත්සක වී තිබේ. **මට්ටකුණ්ඩලී වස්තුව** ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් පහදන්න.''

***නැතහොත්,***

පන්සිය පණස් ජාතක කතා කරුවා කිඳුරියගේ චරිතය මගින් පෙන්වා දෙන්නේ පතිවෘතා ධර්මය සුරකින පරමාදර්ශී ස්ත්‍රී චරිතයකි '' **චන්දකින්නර** ජාතකය ඇසුරෙන් උදාහරණ දෙමින් විමසන්න.

(ලකුණු 15 යි.)

3. තමා හට නොගැළපෙන දේ ප්‍රාර්ථනා කිරීමට යාම හේතුවෙන් පුද්ගලයා විනාශය කරා යන බව ස්වර්ණතිලකා හා උද්දාල යන චරිත ද්වයෙන් ම මැනවින් ඉස්මතුව පෙනෙන බව **ස්වර්ණතිලකා** කතා වස්තුවෙන් ගත් උදාහරණ ඇසුරෙන් පෙන්වා දෙන්න.

***නැතහොත්,***

ජීවිත අත්දැකීම් ඌන වන විට සුකුමාර දිවි ගෙවන්නන් මනා මග පෙන්වීමකින් ජීවිතයේ සැබෑ තතු අවබෝධ කරගැනීමෙන් පසු වගකීමෙන් ක්‍රියා කරන්නේ කෙසේදැයි යන වග **'අනුරුද්ධ කුමාර'** වස්තුවෙන් උගත හැක. උදාහරණ තුනක්වත් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15 යි.)

4. (අ) කෝට්ටේ යුගයෙහි ලියැවුණු සන්දේශ කෘති තුනක් ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

(ලකුණු 07 යි.)

(ආ) ''ගුත්තිලයෙහි එන බරණැස් නුවර වර්ණනය සැප සම්පතින් ආඪ්‍ය මනරම් නගර වර්ණනයකි.'' උදාහරණ දෙමින් විමසන්න.

(ලකුණු 08 යි.)

5. ''කටුක පරිසරයෙන් බැද්දේගම ජනයා පීඩා විඳින ආකාරය බැද්දේගම නවකතාවෙහි ඉදිරිපත් කළ ආකාරය නියමිත උදාහරණ තුනක්වත් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15 යි.)

6. ''වෙසක් පහණ කෙටිකතාව මගින් ළමා මනස මැනවින් නිරූපණය කරන කෙටි කතා කරුවා කෙටිකතාවක තිබිය යුතු ශිල්පීය උපක්‍රමයන් පිළිබඳව මනා අවබෝධයකින් යුතුව එම කෙටිකතාව රචනයට උත්සුක වී තිබේ.'' නියමිත කෙටිකතාව ඇසුරෙන් උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15 යි.)

7. ''කොළඹ යුගයේ පළමු කවි පරපුරේ කාව්‍ය නිර්මාණයන්හි කැපී පෙනෙන අංග දෙක වන්නේ ජාතිකාභිමානී පද්‍ය රචනය හා ළමා පද්‍ය රචනයයි.'' නිර්දිෂ්ට පද්‍ය පන්තීන් ඇසුරෙන් උදාහරණ දක්වමින් පහදන්න.

(ලකුණු 15 යි.)

8. තමා අකමැතිවන අසම්මත ප්‍රේමකතාවක කොටස්කාරිනියක් බවට අනපේක්ෂිත ලෙස පත්වන ස්වර්ණතිලකාට ඛේදනීය ඉරණමකට මුහුණ පෑමට සිදු විය. **"පෙමතො ජායතී සොකො"** නාට්‍යයෙන් නිදසුන් තුනක්වත් ඇසුරෙන් ඉහත කියමන සනාථ කරන්න.

(ලකුණු 15 යි.)